**ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාව - 2019**

-----------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/ 2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනුලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- ශ්‍රී ලංකා නාවික හමුදාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුණද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයෙහි මා විසින් සිදු කල නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛවලට අනුගත නොවීම**

----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/ 2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී එම වත්කම්වලට අදාල ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම සැසඳිය යුතු විය. එසේ නොවන යම් ශේෂ වේනම් ඒවා හඳුනා ගන්නා තෙක් එම වටිනාකම ප්‍රධාන ලෙජරයේ සංශෝධනය කළ යුතු ශේෂ වශයෙන් තබාගත යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාණිජ අත්තිකාරම් ගිණුමට අදාලව ඉකුත් වර්ෂයට අදාල වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ වියදම රු.6,483,191 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදිව සකස් කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ - 6) එකතුව | ගිණුම් නිවැරදිව ඉදිරිපත් කළ | දේපල පිරියත හා උපකරණ රු.54,563,044,894.51 විය යුතු අතර |

| | | | |
|---|---|---|---|
| | රු.54,563,044,895 ක් වූ දේපල, පිරියත හා උපකරණ වටිනාකම මූල්‍ය තත්ව ප්‍රකාශනය තුල රු.51,777,781,170 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම අගය රු.2,785,263,725 කින් අඩුවෙන් දක්වා තිබුණි. | යුතුය. | මූල්‍ය ප්‍රකාශවලට ඇතුලත් කිරිමේදි එක් පිටුවක වටිනාකම වන රු.2,785,263,725 ඉඩම්වල වටිනාකම අත්වැරදීමකින් එකතුවට එකතු වී නොමැති බව කාරුණික ව දන්වා සිටිමි. |
| **(ආ)** | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.2,264,057,163 ක් වුව ද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වත්කම් අත්පත් කර ගැනීම් රු.1,862,631,721 ක් වූයෙන් රු.401,425,442 ක වෙනසක් තිබුණි. | ගිණුම් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. | 2020 වර්ෂයේ පෙබරවාරි මස ගිණුම් සාරාංශය මගින් රු.398,413,816.77 ක මුදලක් ගිණුම්ගත කරන ලදි. ඉතිරි වෙනස උතුරු නාවික විධානයේ දෝෂයක් බැවින් 2020 වර්ෂයේ ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. |

### 1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අත්තිකාරම් 'බී' ගිණුමට අදාල සැසඳුම් ප්‍රකාශය අනුව 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නාවික හමුදාවේ පාලන ගිණුමේ ශේෂය රු. 390,599,202 ක් වූ අතර එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.368,606,975 ක් විය. ඒ අනුව රු.21,992,227 ක් වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුම් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/ 2015 | විශ්‍රාම යන නිලධාරීන්ගෙන් සේවය අවසන් කිරීමට පෙර උත්සව අත්තිකාරම් හිඟ ශේෂ රු. 1,043,270 ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | සේවය අවසන් වීමට කලින් මුළු මුදලම අයකර ගත හැකි වන පරිදි අයකර ගැනීමේ වාරික ගණන අඩු කිරීම හෝ විශ්‍රාම යන විට යම් ගෙවීමට ඇති මුදලකින් අයකර ගැනීම. | අදහස් දක්වා නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) උතුරු මැද නාවික පෙදෙසෙහි අතුරු අග්‍රිම සීමාව මාසිකව රු.2,167,500 ක් වුවත් 2019 වර්ෂයේ ජනවාරි මස සිට ඔක්තෝබර් මස දක්වා මාස 10 තුළ මාසිකව රු.6,997,390 ක සාමාන්‍යයේ මුදලක් අතැති මුදල් ලෙස රඳවා තබාගෙන තිබුණි. | අනුමත අග්‍රිම සීමාව තුළ කටයුතු කිරීමට වගබලා ගත යුතුය. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උතුරු මැද නාවික පෙදෙසෙහි 2019 ඔක්තෝබර් මස 21 දින 16.00 පැයට සහකාර අධ්‍යක්ෂ (මුදල්) භාරයේ තිබුණු සුළු මුදල් සම්බන්ධව කරන ලද භෞතික විගණන පරික්ෂාවේදී විගණනයට ඉදිරිපත් කළ මුදල රු.7,246,340 ක් විය. පසුව බැංකු වාර්තාවලින් ලබාගත් තොරතුරු හා අභ්‍යන්තර විගණන (සිවිල්) විසින් සිදුකරන ලද විගණන පරික්ෂාව අනුව සුළු මුදල් අග්‍රිම ලේඛනයේ එදිනට තිබිය යුතු ශේෂය රු.10,644,391 ක් විය. ඒ අනුව 2019 ඔක්තෝබර් මස 21 දිනට රු.3,398,051 ක මුදල් ඌණතාවයක් විය. | මුදල් සම්බන්ධ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය. . | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | සේවක ණය කාල විශ්ලේෂණය අනුව ශ්‍රී ලංකා නාවික හමුදාවේ දැනට සේවයේ නියුතු නිලධාරීන්ගෙන් හැර වර්ෂයකට වඩා වැඩි කාලයක් තුළ අය නොවී පවතින ණය ශේෂය රු.23,813,970 ක් විය. එය අය විය යුතු මුළු ණය ප්‍රමාණයෙන් සියයට85 ක් විය. එමෙන්ම වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් තුළ අයනොවී පවතින ණය ශේෂය රු.22,056,336 ක්වූ අතර එය අය විය යුතු මුළු ණය ප්‍රමාණයෙන් සියයට 79 ක් විය. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 01, 03 හා 08 ඡේද හා ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | ත්‍රිකුණාමල නාවික කඳවුරෙහි වර්ෂ 5 සිට වර්ෂ 20 කට අධික කාලයක සිට අය නොවූ රු.2,630,371 ක ණය ශේෂයක් පැවතුණි. | ණය ශේෂ අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. | අදහස් දක්වා නොමැත. |

**2.2** **ආදායම් කළමනාකරණය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **(අ)** 2019 වර්ෂයේදී භෝග අස්වැන්න තුළින් ලද රු.8,861,429 ක ආදායම හා රු.3,570,163 ක වියදම විගණකාධිපතිවරයාගේ විගණනයෙන් බැහැරවන බවත්, අස්වැන්න තුළින් ලද ආදායම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර නොකර නාවික හමුදා කෘෂිකර්ම අරමුදලට බැර කර තිබුණු බවක් නිරීක්ෂණය විය. | ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කර ඒ සඳහා වාණිජ අත්තිකාරම් ගිණුමක් සකස් කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. | මෙම ව්‍යාපෘතිවලින් ලබාගන්නා ආදායම් සියල්ල කෘෂි ව්‍යාපෘතීන්වල උන්නතිය හා එහි වැඩි දියුණුව සඳහා ද, නාවික හමුදාවේ සුභසාධක ව්‍යාපෘතීන් වශයෙන්ද යොදාගනු ලබන අතර, මෙම ව්‍යාපෘතියේ ගිණුම් කටයුතු විනිවිදභාවයකින් යුතුව බාහිර විගණන නිලධාරීන්ගේ විගණනයට හා අභ්‍යන්තර විගණන ඒකකයේ විගණනයටත් යටත්ව ඔවුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ |

| | | | |
|---|---|---|---|
| | | | පවත්වාගෙන යනු ලැබේ. තවද වැඩිදුරටත් විගණනය සඳහා ගිණුම් තොරතුරු ඉදිරිපත් කිරීමට හැකියාවක් ඇති බව දන්වා තිබුණි. |
| **(ආ)** | සංශෝධිත ඇස්තමේන්තුව අනුව ආදායමරු.102,000,000 ක් වුවත් ඒසීඒ - 1 ආදායම් ප්‍රකාශයේ සංශෝධිත ඇස්තමේන්තුව රු.110,000,000 ක් ලෙස දක්වා තිබුණි. | තොරතුරු නිවැරදිව ඉදිරිපත් කළ යුතු අතර සංශෝධිත ඇස්තමේන්තුව සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. | 2019 වර්ෂයේ මූලික ආදායම් ඇස්තමේන්තුව 2018 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත්තේ රු.මිලියන 102 ක් ලෙස වුවද මහා භාණ්ඩාගාරය එය රු.මිලියන 210 ක් ලෙස ඉදිරිපත් කර ඇත. 2019 වර්ෂයේ රාජ්‍ය ආදායමට බැර කරන ලද සත්‍ය ආදායම රු.මිලියන 110 වැරදීමකින් ඒසීඒ 01 ආකෘති සංශෝධිත ඇස්තමේන්තු තීරුවේ සටහන් කර ඇත. |

## 2.3 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරාවර්ථන වැය විෂයයන් 33 කට අදාලව රු.1,578,620,383ක ඉතිරිවීම් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 11 කට අදාලව (අනිවාර්ය ඉතිරි කිරීම් හැර) රු.1,363,361,656 ක ඉතිරිවීම් පැවති බව නිරීක්ෂණය විය. එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 100ක අතර පරාසයක පැවතුණි. | කාර්යභාරය ඉටු කිරීම ආරම්භවන කාල වකවානු නිශ්චය කර වර්ෂයේදී ඉටු කළ හැකි කාර්ය ප්‍රමාණයට සරිලන පරිදි ප්‍රතිපාදන සළසා ගත යුතු වීම. | 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරණ ජාතික අයවැය චක්‍රලේඛය අනුව වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් රු.මිලියන 865ක් ඉතිරි කල යුතු අතර ඉතිරි ඉතිරිවීම් ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම නිසා සිදු වී ඇති බව දන්වා තිබුණි. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 04 ක්, එක් දෙපාර්තමේන්තුවක් හා කාර්යාල 02ක් විසින් එකතුව රු.මිලියන 259.37 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට | වෙනත් කාර්යභාරයන් ඉටු කිරීමේදී සැලසුම්කරණය මෙන්ම අවශ්‍ය ප්‍රතිපාදන පමණක් ලබා ගැනීමක් සිදු කල යුතුවීම සහ නිසි | අදහස් දක්වා නොමැත. |

| | |
|---|---|
| ඉන් රු.මිලියන 35.95 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ප්‍රතිපාදනවලින් සියයට 86 උපයෝජනය කර නොතිබුණි. | පසුවිපරම් ආදිය සිදුකර වාර්ෂික ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට වගබලා ගත යුතු වීම. |

## 2.5 තැන්පත් ශේෂයන්

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ 2016 සිට 2018 දක්වා ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් ලබාදුන් මුදල රු.135,220,167 ක් වූ අතර උතුරු නාවික විධානය විසින් එම ව්‍යාපෘති සඳහා ලබාදුන් වියදම් විස්තරයට අනුව වියදම රු.74,728,091 ක් විය. ඒ අනුව අග්‍රිම ඉතිරිය රු.60,492,076 ක් විය යුතු වුවත්, තැන්පත් ගිණුමේ ශේෂය රු.30,228,488 ක් වූයෙන් රු.30,263,588 කින් තැන්පත් ගිණුමේ ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්වල නිවැරදිතාව ය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | වර්ෂ 2017 හා 2018 දක්වා උතුරු නාවික විධානය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් චෙක්පත් ලැබීම් පිළිබඳ විස්තරය අනුව මුදල් ලැබීම් රු.102,560,101 ක් වුවත්, යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් ව්‍යාපෘති වෙනුවෙන් ලබාදුන් චෙක්පත් විස්තරය අනුව එය රු.135,220,167 ක් විය. ඒ අනුව රු.32,660,066 ක වෙනසක් තිබුණි. | මුදල් සම්බන්ධව අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 381 ප්‍රකාරව රාජකාරී බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, ඊට | රාජකාරී බැංකු ගිණුම් සඳහා භාණ්ඩාගාරයේ | එවකට ඒ සම්බන්ධව කටයුතු කළ නිලධාරීන් දැනට විශ්‍රාම ගොස් ඇත. එබැවින් භාණ්ඩාගාර |

| | | |
|---|---|---|
| පටහැනිව 74976591 දරන බැංකු ගිණුම කෘෂි ආදායම් රැස් කිරීම සඳහා විවෘත කර පවත්වාගෙන ගොස් තිබුණි. | පූර්ව අනුමැතිය ලබාගත යුතු වේ. | අනුමැතිය ලබා නොගැනීම සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කිරීමට නොහැක. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **ප්‍රසම්පාදනයන්**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ) වගන්තිය ප්‍රකාරව සියළුම ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වේ. රු.48,295,411 ක් වටිනා භාණ්ඩ, සේවා හා වැඩ පිළිබඳ ප්‍රසම්පාදනයන් 17 කදී මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල නොකර භාණ්ඩ, සේවා හා වැඩ පිළිබඳ ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ) වගන්තිය ප්‍රකාරව සියළුම ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතුය. | මින් ඉදිරියට මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් අදාල මිලදී ගැනීම් කටයුතු සිදුකරනු ලැබේ.<br><br>අළුත්වැඩියාවන්වලට අදාල අවශ්‍යතාවය හඳුනාගත හැකි වුවද, අළුත්වැඩියාවේ ප්‍රමාණය නිශ්චිතවම තහවුරු කර ගත හැක්කේ නෞකාව වියළි තට්ටාංගනගත කොට අදාල මිනුම් හා පරීක්ෂාවන් සිදුකිරීමෙන් පසුව බවත්, එමගින් පූර්ව පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම ප්‍රායෝගික ගැටළුවක් ඇති බවත් දන්වා තිබුණි. |
| (ආ) නන්දිමිත්‍ර නෞකාව අළුත්වැඩියා කිරීම සඳහා දෙවනවර ලංසු කැඳවන අවස්ථාවේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ප්‍රකාරව වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යොදාගෙන තිබුණි. නමුත් යුධ නෞකාවන් සම්බන්ධයෙන් ඉහළ වටිනාකමක් සහිත පහසුවෙන් සපයාගත නොහැකි භාණ්ඩ, සේවා හෝ වැඩ වන අතර ලංසු කැඳවීම සඳහා වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යොදා නොගත යුතු විය. | ලංසු කැඳවීම සඳහා නිවැරදි ප්‍රසම්පාදන ක්‍රමයක් භාවිතා කළ යුතු වීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 යටතේ Shopping ක්‍රමය යටතේ ලංසු කැඳවා ඇති බව දන්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තිය ප්‍රකාරව රු.250,000 ක් ඉක්මවන වැඩ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත්, එකතුව රු.27,542,958 ක් වූ වැඩ ප්‍රසම්පාදනයන් 10 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තිය ප්‍රකාරව රු.250,000 ක් ඉක්මවන වැඩ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමක් අත්සන් කළ යුතු වීම. | 2019 ජූනි මස 17 වන දින පැවති 2019 පළමු කාර්තුවට අදාල අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කළ පරිදි නීති අංශය සමඟ සම්බන්ධ වී නෞකා වියළි තටාකාංගන අළුත්වැඩියා සියල්ල ආවරණය වන ලෙස එක් නෞකාවක් සඳහා එක් ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කළ බව දන්වා තිබුණි. |

**3.2**

**වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණ විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | --------------- | ------------------------ |
| (අ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂය (2019 ජනවාරි 01 වන දිනට) හා පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ අවසාන ශේෂය (2018 දෙසැම්බර් 31 දිනට) අතර රු.මිලියන 15,895 ක වෙනසක් පැවතුණි. | ගිණුම් නිවැරදිව ඉදිරිපත් කළ යුතු වීම. | 2018 වර්ෂයට ඇතුලත් කලයුතු ආරම්භක ශේෂයන් 2019 වර්ෂයේ අරම්භක ශේෂවලට ඇතුලත් වීමෙන් (රු.මිලියන 15,895) වෙනසක් සිදුවී බැව් කාරුණිකව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් වත්කම්වල වටිනාකම රු.මිලියන 54,563 ක් වූ ශේෂය, ස්ථාවර වත්කම් ලේඛනයේ දැක් වූ රු.මිලියන 64,220 ක් වූ ශේෂය සමඟ නොගැලපුණි. එබැවින් ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් ශේෂයන්හි නිරවද්‍යතාවය පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීමට නොහැකි විය. | ගිණුම් නිවැරදිව ඉදිරිපත් කළ යුතු වීම. | 2019.12.31 දිනට අවසාන භාණ්ඩාගාර ගිණුම් වාර්තාව සමග සමාන වේ. |
| (ඇ) | වෙනත් ආයතන සතුව තිබුණු වටිනාකම විගණනයට ඉදිරිපත් නොවූ ඉඩම් හෙක්ටයාර් 448.08 ක් ද, වටිනාකම විගණනයට ඉදිරිපත් නොවූ වාහන 17 ක් ද | වෙනත් ආයතන සතු වත්කම් පරිහරණ කිරීමේදී ඒවා නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීමේ | පවරාගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව දන්වා |

| | | |
|---|---|---|
| නාවික හමුදාව විසින් විධිමත් පවරා ගැනීමකින් තොරව පරිහරණය කරමින් තිබුණි. | පිරිවැයද ශ්‍රී ලංකා නාවික හමුදාවට දැරීමට සිදුවන බැවින් එම ගනුදෙනුවල නීත්‍යානුකූලභාවය කෙරෙහි ගැටළු සහගත විය හැකි බැවින් එම වත්කම් විධිමත්ව පවරාගත යුතු වීම. | තිබුණි. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | --------------------- |
| (අ) | වර්ෂ 05 ක් ඉක්මවූ වාහනයක්, වර්ෂ 02 ක් ඉක්මවූ වාහන 03 ක්, වර්ෂයක් ඉක්මවූ වාහන 20 ක් අළුත්වැඩියා ප්‍රමාදවීම හේතුවෙන් ධාවනයෙන් තොරව පැවතුණි. | මෝටර් වාහනවලින් උපරිම ප්‍රයෝජනය ගැනීම සඳහා කඩිනමින් අළුත්වැඩියා කොට භාවිතයට ගත යුතුය. | අළුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. |
| (ආ) | වර්ෂ 02 ක් ඉක්මවූ රු.496,000 ක් වටිනා යන්ත්‍ර 02 ක් ද, වර්ෂයක් ඉක්මවූ රු.124,550 ක් වටිනා යන්ත්‍ර 05 ක් ද අළුත්වැඩියාව සඳහා බාහිර ආයතන වෙත භාරදී තිබූ නමුත්, අළුත්වැඩියාවන් නිමකර ආපසු නාවික හමුදාවට භාරදී නොතිබුණි. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජනය ගැනීම සඳහා කඩිනමින් අළුත්වැඩියා කොට භාවිතයට ගත යුතුය. | අළුත්වැඩියාවන් සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. |
| (ඇ) | වර්ෂ 04 ක් ඉක්ම වූ යන්ත්‍රයක් ද, වර්ෂ 03 ක් ඉක්මවූ යන්ත්‍ර 06 ක් ද, වර්ෂ 02 ක් ඉක්මවූ යන්ත්‍ර 11 ක් ද, වර්ෂයක් ඉක්ම වූ යන්ත්‍ර 17 ක් ද, සඳහා වූ ඇණවුම් කරන ලද අමතර කොටස් නොලැබීම නිසා අළුත්වැඩියා කිරීම ප්‍රමාද වී තිබුණි. | අමතර කොටස් ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂම විය යුතුය. | අමතර කොටස් ඉල්ලුම් කර ඇති බවත් අළුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතින බවත් දන්වා තිබුණි. |
| (ඈ) | අළුත්වැඩියා කළ නොහැකිව ගර්හිත තත්ත්වයට පත්ව තිබුණු වර්ෂ 10 ට වැඩි ස්ථාවර වත්කම් විෂයයන් 07 ක් ද, වර්ෂ 5 – 10 ත් අතර විෂයයන් 08 ක් ද, වර්ෂ 3-5 ත් අතර විෂයයන් 80 ක් ද, වර්ෂ 1-3 ත් අතර විෂයයන් 430 ක් ද, නිෂ්කාර්ය ලෙස ගබඩාව තුළ ගොඩගසා තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | පොදු 47 මඟින් සුදුස්සක් කිරීම සඳහා නිර්දේශ කර ඇති බවත්, ඇතැම් ස්ථාවර වත්කම් ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත්කරමින් පවතින බවත් දන්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පිරිවැය/ ගැනුම් මිල විගණනයට ඉදිරිපත් නොවූ නෞකා/ යාත්‍රා 2 ක් වර්ෂ 02 කට අධික කාලයක සිටද, නෞකා/ යාත්‍රා 06 ක් හා ත්‍යාග වශයෙන් ලැබී තිබුණු යාත්‍රාවක් අළුත්වැඩියා කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් වර්ෂයකට අධික කාලයක සිට අක්‍රිය තත්ත්වයේ පැවතුණි. | යාත්‍රාවලින් උපරිම ප්‍රයෝජනය ගැනීම සඳහා ඉක්මණින් අළුත්වැඩියා කොට භාවිතයට ගත යුතුය. | අළුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතින බවත්, අවශ්‍ය අමතර කොටස් ඉල්ලුම් කර මේ වන තෙක් ලැබී නොමැති බවත් දන්වා තිබුණි. |
| (ඊ) | පිරිවැය/ වටිනාකම විගණනයට ඉදිරිපත් නොකළ නෞකා/ යාත්‍රා 02 ක් වර්ෂ 09 කට අධික කාලයක සිටද, පිරිවැය රු.මිලියන 19.9 ක් වූ යාත්‍රාවක් වර්ෂ 08 කට අධික කාලයක සිටද, රු.මිලියන 19.8 ක් පිරිවැය වූ නෞකා/යාත්‍රාවක් වර්ෂ 06 කට අධික කාලයක සිටද, අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | පී 419 – යාත්‍රාව ආපදා මර්ධන පුහුණු කිරීමට හැකිවන පරිදි සැකසීමට අනුමත කරන ලද බවත්,<br>පී 470 – යාත්‍රාව නව පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ අළුතින් එංජිමක් සවි කිරීමට යෝජනා වී ඇති බවත්,<br>පී-103 යාත්‍රාව අපහරණය කිරීමට කටයුතු කරමින් පවතින බවත්,<br>ඒ-530 අළුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතින බවත්, දන්වා තිබුණි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ----------------- |
| (අ) | <u>නිල ඇඳුම් කාර්ය මණ්ඩලය</u><br>නිත්‍ය නිලධාරීන් 202 ක් ද, ස්වේච්ඡා නාවිකයින් 60 ක් ද සහ නිත්‍ය නාවිකයින් 7,570 ක් සහ ස්වේච්ඡා නාවිකයින් 1207ක්ද, පුරප්පාඩු පැවතුනි. තවද, විශේෂ ක්‍රමය යටතේ බඳවාගෙන තිබුණු නාවිකයින් 4640ක් සම්බන්ධයෙන් කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර අතිරික්ත සේවකයන් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වීම. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | <u>**සිවිල් කාර්ය මණ්ඩලය**</u> | | |
| | ජ්‍යේෂ්ඨ මට්ටමේ නිලධාරියෙක්ද,තෘතියික මට්ටමේ නිලධාරින් 11ක්ද, ද්විතියික මට්ටමේ නිලධාරින් 47 ක්ද සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 277ක්ද, වශයෙන්පුරප්පාඩු 52 ක් පැවතුනි. තවද, අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන තිබුණු සේවකයින් 52ක් සම්බන්ධයෙන් කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම සහ අතිරික්ත සේවකයන් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වීම. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. |
| (ඇ) | 2019 වර්ෂය අවසාන වන විට නිලධාරීන් හා නාවිකයින්ට අදාල විනය පරීක්ෂණ 941 ක් ක්‍රියාත්මකව පැවතුණි. එයින් විනය පරීක්ෂණ 587 ක් වර්ෂ 1 ත්, වර්ෂ 3 ත් දක්වා ප්‍රමාද වී තිබුණු අතර විනය පරීක්ෂණ 84 ක් වර්ෂ 3 කට වැඩි කාලයක් ප්‍රමාද වී පැවතුනි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/ 2019 අනුව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | නිලධාරීන් 387 දෙනෙකු වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | 1988 අංක 74 පනතින් සංශෝධිත 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |